

# සංක්‍රමණිකයකුගේ සටහන

## පලාත් සභා ඡන්දෙ

තමන්ට අවශ්‍ය ලෙස රටේ ජනතාවගේ මනස හසුරවන්න රාජ්‍ය ජනමාධ්‍ය ඇතුළුව සෙසු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හසුරුවන්නේ කෙලෙසද කියලා හොඳම ආදර්ශය අපට ලබා දුන්නෙ රාජපක්ෂ ආන්ඩුව. ඒක කොයි තරම් සාර්ථක ද කියනවා නම් දවසේ පැය විසිහතරම අවංක දේශපාලනයේ යෙදෙන ජවිපෙ මන්ත්‍රීවරු සංඛ්‍යාව දාහතේ ඉඳලා තුනට බහිනවා. යාපනේ හමුදාව කොටුවෙලා ඉන්නකොට සටනක් කරල කට්ටිය ගොඩගත්ත ජනරාල් ජානක පෙරේරා ද්‍රෝහියෙක් වෙනවා.

මේක රාජපක්ෂ යුගය. තමන්ට අවශ්‍ය දේ කෙසේ හෝ ලබාගෙන එය සාධාරණීකරනය කරන්න හොඳ පසුබිමකුත් ඔවුන් හදාගෙන ඉවරයි. මේ යුද්දේ පිහිටෙන් ඔවුන් තව බොහෝ දේ කරාවි. මහින්ද රාජපක්ෂ යනු කොටි සටනේදී ලෝක ජනමතය තබා ඉන්දියාවටවත් නොනැමෙන නායකයෙක් ලෙස නමක් හදාගෙන ඇති අපූරුව බලන්න. තිරයෙන් පසුපස සිදුවන ගනු දෙනු පිලිබඳව ජනතාව නොදැනුවත්භාවයේ ගිල්වා ඇති ආකාරය බලන්න. සිය නිහඬතාව වෙනුවෙන් තෙල් සමීක්ෂණ කටයුතු ගල් අඟුරු බලාගාර දකුණේ දුම්රිය මාර්ග පද්දති ත්‍රිකුණාමලයේ ආර්ථික කලාප තෙල් බෙදා හැරීමේ කටයුතු ඉන්දියාව කප්පම් ලෙස ගෙන ඇති බව ජනතාවට වසන් කොට ඇති අයුරු බලන්න. මේ ගැන කතා කරන කවුරු වුවත් රජයට යුද්ධයට රට බේරාගැනීමට විරුද්ධ අයෙක් වන ආකාරයත් බලන්න. මිත්‍රවරුනි. දැන් නම් කැප්පෙටිපොල හෝ පුරන් අප්පු වලෙන් නැගිටලා ආවත් ආන්ඩුවට පක්ෂ නොවේ නම් දේශ ද්‍රෝහියෙක් වෙනවා නිසැකයි. අපි බලන් ඉමු මේ ගමන දෙස. අපට සිහිවෙන්නේ ජේ ආර් රජයේ මුල් කාර්තුවයි. ආන්ඩුව අලුත් ගමනක් යාමට සැරසෙන්නේ පරන පාරෙන් බවයි අපට නම් පෙනෙන්නෙ. ඔහොම යං...

## සුසන්තිකා

දශක එකහමාරකට වැඩි කාලයක් තිස්සේ සිව් වසරකට වරක් දැල්වෙන ශ්‍රී ලංකාවාසීන්ගේ අපේක්ෂාව අවසන් වතාවට සුන්වුණා. අපට හුසේන් බෝල්ට්ගේ පෙල්ප්ගේ නව වාර්තා වලට වඩා ඇඟට දැනෙන්නේ එයයි. සුසන්තිකා මෙවර ඔලිම්පික් උළෙලේ දී පදක්කමක් ලබා ගැනීම සිහිනයක් බව දැන දැනත් ඇය තරගයට සහභාගි වුන මොහොතේ පටන් හැම දෙනාගේම හිතේ කොනක පුංචි අපේක්ෂාවක් දැල්වුන බව බොරුවක් නොවෙයි. ප්‍රශ්නයක් නැහැ. ඇය අපට ගෙනා කීර්තිය ප්‍රමානවත්. ප්‍රශ්නය ඇගෙන් පසු ක්‍රීඩාවට යන දසාව. අපේ මලල ක්‍රීඩාවේ ප්‍රගතිය ගැන හොඳම තත්ව වාර්තාව එයයි. ඇයට ආදේශිකාවක් ජේනතෙක් මානයක නැහැ. සන්නසේ අපි ඇයට සුබ පතනවා. ගැහැනියකට මේ සමාජය තුල යම් ස්ථාවරයකට ඒම සඳහා දක්ෂතාව සමග හොඳ කටක් ද තිබිය යුතු බව ඇය පෙන්වා දුන්නා. ඇගෙන් පසු ආදේශකයක් නොතිබුනත් එවන් කෙනෙක් බිහි කර ගැනීම සඳහා ඇගේ අද්දැකීම් නව පරපුරට ලබා දීමට ඇයට අවස්ථාවක් ලබා දීමට මලල ක්‍රීඩා සංගමයේ මහත්වරුන් ගේ ඇස් පෑදේවායි අපි පතනවා.

## ඔලිම්පික්

මීලඟ ලෝක බලවතා වීමේ සුදුසුකම් ලෝකයට පෙන්වන්න චීනය ඔලිම්පික් උළෙල යොදාගත් හැටි අපූරුයි. සංවිධානය තාක්ෂනය හැකියාව අතින් තමන් බටහිර රටවල් හා සමතැන් බව ඔවුන් මොනවට ප්‍රදර්ශනය කලා. ලෝ වැසියන් එහි අසිරිය විඳ ගනිද්දී අපට එහි යම් අඩුවක් දැනුනා. මේ උලෙල සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇරුනකොට චීන සාමාන්‍ය ජනතාවගේ සහභාගීත්වය කැපී පෙනුනා. බොහෝ ක්‍රීඩාංගන දිස්වූයේ ජනශුන්‍ය ආකාරයට. ආරක්ෂක හේතූන් මත ක්‍රීඩාංගන හිස් වුවත් බෙයිජින් නගරයේ සිටි මිලියන ගනනක ජනතාවට සිදුවූයේ කුමක්ද? මිලියනයක් පමන ජීවත් වූ නගරයක් හරහා ඔලිම්පික් මැරතන් තරගයක් බයිසිකල් තරගයක් පැවැත්වෙද්දී මග දෙපස නැරඹීමට සිටියේ කොපමණ අල්ප පිරිසක් ද? ඒ සා විශාල මාර්ග පදික වේදිකා මගී මාරුවන ස්ථාන වල තිබුනේ දැඩි පාලු ස්වභාවයක්. ජනතාව ඔලිම්පික් තරගාවලියෙන් ඈත් වූවා ද? ඈත් කරන ලද්දේ ද? රටක් කොතෙක් දියුණු වුවත් රටක ජනතාවගේ මානුෂික අයිතීන් වලට සීමා පැනවෙනවා නම් ඒ දියුනුවෙන් ඇති ඵලය කුමක් ද? චීනයේ මානව හිමිකම් ඇහිරීම් ගැන බටහිර ජනමාධ්‍ය නගන චෝදනා ඔප්පු කර පෙන්වන්න අවස්ථාවක් චීනය විසින්ම ලබා දීම ගැනයි අපේ කනගාටුව.

## ආරේ ගති

මෙල්බර්න් සමාජයට වැඩ කරපු මිනිසුන්ව ඉහලින් ඔසවා තැබිය යුතුයි. ඒකේ අවුලක් නැහැ. අපිත් එකඟයි. ඒත් ඒ ඉස්සිල්ලෙදි තවත් අගය කල යුතුම මිනිහෙක්ව පාගල නැති කරල දාන්න හදනවා නම් අපි ඊට විරුද්ධයි.

මේ කතා කරන්නේ මේ දිනවල අන්තර්ජාලයේ රට පිලිගත් පුද්ගලයෙකු අපපහාසයට ලක් කරමින් යවමින් තිබෙන ඊමේල් කැලෑ පත්තරය ගැනයි. ඒවා අන්තිම බාල පහත් වැඩ මිත්‍රවරුනි.

පොතක් ගැන සංවිධානයක් ගැන හැම දෙනාටම හැම විටම සම අදහස් ඇති වෙන්නේ නැහැ. එක් එක් කාරනා ගැන එක් එක් අයට ඇති මත විවිධයි. ඒ නිසයි විවේචන සංවාද ඇති වෙන්නේ. සමාජයක සංවර්ධනය සඳහා විවේචන අවශ්‍යයි. තන් යමක් ගැන දරන අදහසට විරුද්ධව තවත් කෙනක් දක්වා තිබෙන අදහසකට එකඟ නැත්නම් එතනදි කරන්න තියෙන්නෙ පහත් පෙලේ කැලෑ පත්තර යවන එක නෙවෙයි. ශිෂ්ට ලෙස නිර්භීතව ඉදිරියට ඇවිත් පිලිතුරු දීමයි. වැදගත් විදිහට පුවත්පතකින් කළ සංවාදයක් අලලා තුට්ටු දෙකේ කැලෑ පත්තර ඊමේල් කරලා කාට මඩ ගහන්නද මේ හදන්නෙ? මේ පහත් වැඩෙන් නැති වෙන්නේ තමන් ආරක්සා කරගන්න උත්සාහ කරන අයගේම ගෞරවය බව අමතක වීම ගැන කනගාටුයි. තමන් මේවට සම්බන්ධ නැති වුනත් මේ නස්ප්‍රුක් ගෝලයෝ කරන අමන වැඩ ගැන අදාල කට්ටිය අවධානයෙන් ඉන්නවා නම් හොඳයි. මේ දෙපාර්ශවයම අප අගය කරන නිසයි මෙහෙම ලියන්නේ.

## කාරිය කෙරෙන තුරු

විවිධ සංවිධාන හා යම් යම් අය පෞද්ගලික මට්ටමින් රඟදක්වන නාට්‍ය ගීත ප්‍රසංග චිත්‍රපට වෙනුවෙන් කෙරෙන ප්‍රචාරක කටයුතු වලදී මාධ්‍ය මගින් කෙරෙන සේවය සුලුපටු නැහැ. එහිදී සමහර විට නොමිලයේත් තවත් සමහර විටෙක මුද්‍රන වියදම් පියවා ගැනීම සඳහා ඉතා සාධාරන මුදලක් අය කරමිනුත් පුවත්පත් හරහා ප්‍රදර්ශනය කෙරෙන දැන්වීම් වලින් සංවිධායකයන්ට අත්වන වාසිය නම් අසීමිතයි. කනගාටුවට කාරනය නම් බොහෝ සංවිධායකයනට තමන්ගේ කාරිය හමාර වුනාට පසු ඒ බව අමතක වීමයි.

තමන්ගේ කාරිය කරගත් පසුව අඩුම වශයෙන් තමන්ට උපකාර කළ මාධ්‍ය වලට තුති පුදන්න වත් මේ අයට මතක් වෙන්නෙ නැහැ. මේ ස්තුතියෙන් මාධ්‍යය ලැබෙන අමතර වාසියක් නැහැ. නමුත් සතයක් වත් වැය නොවන ස්තුතියක් වත් නැති වුනාම "අනේ අපි මේ මිනිස්සුන්ට මොනාට උපකාර කරනවාද" කියලා මාධ්‍ය වල ඇත්තන්ට හිතෙන එක වලක්වගන්න නම් අමාරුයි.

සංක්‍රමණිකයා

# රජරට හා සබරගමුවෙන් පසු...?

*අසීමිත බලය දූෂනය හා ඒකාධිපති භාවයට මගපාදනබවප්‍රජාතන්ත්‍රවාදයේ සම්මත සිද්ධාන්තයකි. එක්සත් ජාතික පක්ෂයේ පරිහානියට ප්‍රධාන හේතුව ඉතිහාසයේ කවරදාකවත් නොවූ තරම් දුර්වල නායකත්වයක් බව ඉඳුරාම පැහැදිලිය. ජනතා විමුක්ති පෙරමුණ ඉතාම අසරණ තත්වයකට මේ මැතිවරණයේ ඇද වැටුන බව පැහැදිලිව පෙනේ. උදාහරණයක් වශයෙන් රක්වාන මැතිවරන කොට්ටාශයේ වතු කම්කරු පක්ෂයට ප්‍රමාණවත් චන්ද ප්‍රමාණයක් ලබා ගැනීමට ජ.වි.පෙ ට නොහැකි වීම අභාගපයකි.*

දින කීපයකට පෙර අවසන්වූ උතුරු මැද හා සබරගමු පලාත් සභා මැතිවරනය බොහෝ දෙනාගේ අවධානයට යොමු වූ බව කිව යුතු නොවේ. මේ මැතිවරණයේදී ප්‍රධාන ප්‍රශ්න කිහිපයක් චන්දදායකයාගේ පමණක් නොව රටේ ඉතිරි පලාත් වල ජනතාවගේද සැලකිල්ලට යොමු වූයේ ය.

ආණ්ඩු පක්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ප්‍රධාන තර්කය වූයේ යුද්ධය ජයග්‍රහණය කරා ගෙන යාමට රජය දරන ප්‍රයත්නයට අනුබල දීමක් වශයෙන් ජනතාව ඡන්දය ප්‍රකාශ කරනු ඇත යන්නය. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන තුරුම්පුව වූයේ ඉහල යන ජීවන වියදම හා පසුගිය අවුරුදු කීපය තුළ පලාත් සභාවේ සැලකිය යුතු වර්ධනයක් සිදු වී නැති බවය. ජනතා විමුක්ති පෙරමුණේ උපක්‍රමය වූයේ යුද්ධය හා පලාත් සභා මැතිවරණය පටලවා ගැනීම වරදක් බව ය. මැතිවරණයේදී ප්‍රචන්ඩ ක්‍රියා බහුල වූ බවට දෙපක්ෂයම එකිනෙකාට චෝදනා කළහ. ශ්‍රී ලංකාවේ සර්ව ජන චන්දය ලැබූ දා පටන් සෑම මැතිවරණයකදීම අඩු වැඩි වශයෙන් ප්‍රචන්ඩ ක්‍රියා සිදු වූ බව ඉතිහාසය ඔප්පු කරයි.

1936 මහ මැතිවරණයේදී දැදිගම ආසනයේ ප්‍රචන්ඩ ක්‍රියා නිසා එක්තරා ප්‍රදේශයකට අයත් චන්ද දායකයින් 8000 දහසකට වැඩි සංඛ්‍යාවකට චන්ද පොලවල් කරා ඒමට නොහැකි වූ බව පවසන ලදී. එසේම ඉතාම සාමකාමීව මැතිවරණය පැවැත්වුන මාතලේ කොට්ටාශයේ ප්‍රතිඵල නිකුත් වූ මොහොතේම වෙඩි තැබීමකින් දෙදෙනෙකු මියගොස් ජයග්‍රාහක බර්නාඩ් අළුවිහාරේ මහතා ඇතුළු තවත් කීපදෙනෙක් තුවාල ලැබූහ.

1942 උතුරු කොළඹ මැතිවරණයේදී දාමරික ක්‍රියාවල යෙදුනේ යැයි මැතිවරණ පෙත්සමකදී ඔප්පු වූ නිසා ඒ අසුන ජයගත් ජෝසප් මහතාට පමණක් නොව ඔහුගේ ආධාර කරු වූ කම්කරු පක්ෂයේ නායක ඒ. ඊ. ගුණසිංහ මහතාටද මැද කොළඹ අසුන අහිමි කරන ලද්දේ ශ්‍රේෂ්ඨාධිකරණයෙනි. ඊට පසුද ප්‍රචණ්ඩ ක්‍රියා මගින් චන්දදායකයින් බිය ගැන්වීම නිසා නුවරඑළිය සහ ගම්පොල ජයග්‍රාහකයින්ට අසුන අහිමි විය.

කෙසේ වුවද 1978 බිහිවූ නව මැතිවරණ ක්‍රමය සමග බිහිවුන මනාප සටන නිසා එකම පක්ෂයේ අපේක්ෂකයන් අතරද ප්‍රචන්ඩත්වය පැතිරෙන්නට පටන් ගත්තේය. මේ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට මැතිවරණ කොට්ඨාශ 27න් එකක්වත් දිනාග ැනීමට නොහැකි වීම එතරම් හිතදායක නොවේ. මක් නිසාද යත් මෙබඳු ප්‍රතිඵලයක් මහා මැතිවරණයකදී පිලිබිඹු වුවහොත් එය 1977 දී මෙන් ඒක පාක්ෂික ඒකාධිපති වියරුවකට හැරෙන්නට ඉඩ ඇති නිසාය. අසීමිත බලය දූෂනය හා ඒකාධිපති භාවයට මග පාදන බව ප්‍රජාතන්ත්‍රවාදයේ සම්මත සිද්ධාන්තයකි. එක්සත් ජාතික පක්ෂයේ පරිහානියට ප්‍රධාන හේතුව ඉතිහාසයේ කවරදාකවත් නොවූ තරම් දුර්වල නායකත්වයක් බව ඉඳුරාම පැහැදිලිය. ඩී එස් සේනානායන, ඩඩ්ලි සේනානායක, ජේ ආර් ජයවර්ධන ආර් ප්‍රේමදාස යන නායකයින් සියල්ලටම මැතිවරණයක් කරා පාක්ෂිකයින් මෙහෙයවීමට තරම් පෞරුෂත්වයක් දකින්නට තිබුනේය. ජනතා විමුක්ති පෙරමුණ ඉතාම අසරණ තත්වයකට මේ මැතිවරණයේ ඇද වැටුන බව පැහැදිලිව පෙනේ. උදාහරණයක් වශයෙන් රක්වාන මැතිවරන කොට්ටාශයේ වතු කම්කරු පක්ෂයට ප්‍රමාණවත් චන්ද ප්‍රමාණයක් ලබා ගැනීමට ජ.වි.පෙ ට නොහැකි වීම අභාග ්‍යයකි.

අවසාන වශයෙන් කිවයුත්තේ විපක්ෂය මේ මැතිවරණයේ ජනතා තීරණය පාඩමකට ගෙන ප්‍රධාන ප්‍රශ්නය වූ ජනවාර්ගික අර්බුදය විසඳීමට පියවර ගත යුතු බවය. එය කල හැක්කේ පැසිස්ට්වාදී දාමරික බලය පරාජය කරන අතරම දෙමළ ජන වර්ගයේ සාධාරණ අපේක්ෂාවන්ද ඉටු වන අන්දමේ නව රාජ්‍ය ක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට ක්‍රියා කිරීමෙන් පමණකි.



*ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්*

එස්. පියසේන